# පරිශිෂ්ටයන්

## පළමුවැනි පරිශිෂ්ඨය

(අ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1970 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකුවේ සහ බැංකු ආයතන කටයුතු හා ගනුදෙනු වලට අදළ කොටස්.

(ආ) 1970 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

## (අ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1970 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටාගත් මහ බැංකුවේ සහ බැංකු ආයතන කටයුතු හා ගනුදෙනු වලට අදාළ කොටස්.

**1970 අංක 5 දරන කෘෂිකාර්මික ණය දෙන ආයතන (සංශෝධන) පණත**

**කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**(අනුමත කළ දිනය: 1970 ජනවාරි 27)**

1. මේ පනත 1970 අංක 5 දරන කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

2. කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතන ආඥාපනතේ 51 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ග) ඡේදයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් ඡේදය අන්තර්ගත කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (ගග) ආයතනය සහ අවස්ථාවෝචිත පරිදි, රජය, ශ්‍රී ලංකා මහා බැංකුව හෝ ඒ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අන් කිසි ස්ථානයක් අතර ගිවිසුමකින් නිශ්චය කළ හැකි නියමයන් සහ කොන්දේසි පිට රජයෙන්, ශ්‍රී ලංකා මහා බැංකුවෙන් හෝ ඒ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඒ අන් ස්ථානයෙන් මුදල් ණයට ගැනීම හෝ තැන්පත් කිරීම් භාර ගැනීම;"

**1970 අංක 6 දරන ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත.**

**ලංකා රජයේ උකස් බැංකු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**(අනුමත කළ දිනය: 1970 ජනවාරි 27)**

1. මෙ පනත 1970 අංක 6 දරන ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

2. මින් මතු මෙ පනතෙහි ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන (1968 අංක 33 දරන පනතින් සංශෝධිත) ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 2 වන වගන්තියෙහි ''ණය'' යන පදයේ අර්ථ කථනයෙහි ''එයට ඇතුළත් වේ;'' යන යෙදුම වෙනුවට ''එයට ඇතුලත් වේ; එහෙත් බැංකුවේ කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන වැටුප් අත්තිකාරම් කිසිවක් එයට ඇතුළත් නොවේ;'' යන යෙදුම ආදේශ කිරීමෙන් එම වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 10 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:-

10. ''සෑම අධ්‍යක්ෂවරයකු සාමාන්‍යයෙන් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබියයුතු අතර ඊට කලින් ඔහු මියගියහොත්, විශ්‍රාම ලැබුවහොත්, හෝ ඉවත් කරනු ලැබුව හොත් හෝ නුසුදුසු වුවහොත් මිස ඒ කාලය සඳහා ඔහු ධූරය දැරිය යුතුය.''

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 12 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කෙරේ.

(අ) එම වගන්තියේ (1) වන උප වගන්තිය අවලංගු කිරීමෙන් සහ පහත සඳහන් අලුත් උප වගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන්:-

''(1) කිසිදු හේතුවක් නොදක්වා ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ වරයකු ඉවත් කළ හැකිය;'' සහ

(ආ) එම වගන්තියේ 4 වන උප වගන්තියේ ''කිසිදු පාර්ලිමේන්තු නියෝජිතයකු'' යන ප්‍රකාශනය වෙනුවට ''කිසිදු සෙනෙට් සභිකයෙක් හෝ පාර්ලිමේන්තු නියෝජිතයකු'' යන ප්‍රකාශනය ආදේශ කිරීමෙන්:-

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියෙහි 17 අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

17 අ. ඇමතිවරයා විසින් මහ බැංකුවේ මුදල් මණ්ඩලය විමසා ප්‍රතිපත්ති පිළිබඳ කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය වෙත සාමාන්‍ය විධාන නිකුත් කරනු ලැබිය හැකිය.''

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ ''නියම කිරීම හා වෙනස් කිරීම'' යන යෙදුම වෙනුවට ''මේ පනතේ මී ළඟට ඇති විධිවිධානවලට යටත්ව, නියම කිරීම හා වෙනස් කිරීම'' යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ (1968 අංක 33 දරන පනතින් ඇතුළත් කරනු ලැබූ) 70 ආ වන උප වගන්තියේ (ඇ) ඡේදයෙහි ''මුල් අයිතිකරු'' යන වචන වෙනුවට ''අයිතිකරු'' යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) (1) වන උප වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරනු ලැබූ සංශෝධනය 1968 අගෝස්තු මස 1 වැනි දින සිට ක්‍රියාත්මකවී ඇතැයි, සියලු කාර්යයන් සඳහා, සැලකිය යුතුය.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි, ඒ උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) (1 අ) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, බැංකුව විසින් සේවයෙහි යෙදවිය යුතු කණිෂ්ඨ සේවක මණ්ඩලය, ඔවුන්ගේ සේවා කොන්දේසි, අයිතිවාසිකම්, යුතුකම්, හා වරප්‍රසාද සහ ඊට සම්බන්ධ වෙන යම් කරුණු නියම කිරීම;" තව ද

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය අන්තර්ගත කිරීමෙන්: -

"(1 අ) 93 (1) වන වගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් කරුණුවලින් යමක් සම්බන්ධයෙන් කණිෂ්ඨ සේවක මණ්ඩලය පිළිබඳව ව්‍යවස්ථා පැනවීමට (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි ඇති කිසිවකින් මණ්ඩලයට බලය පවරනු ලැබේ යැ යි හෝ බලය දෙනු ලැබේ යැ යි නොසැලකිය යුතුය, නැතහොත් එලෙස තේරුම් කර නො ගත යුතුය."

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන්: -

"(අ) බැංකුවේ සාමාන්‍යාධිකාරීගේ හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ බලතල හා යුතුකම් ද, ඔවුන්ගේ සේවා කොන්දේසි ද, ඊට සම්බන්ධ වෙන යම් කරුණු ද නියම කිරීම;" තවද

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) බැංකුවේ කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වැටුප්, ප්‍රසාද මුදල් සහ (ගමන් වියදම් හෝ යැපීම හෝ අන්කිසි) දීමනා නියම කිරීම,"

**1970 අංක 16 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත**

**1958 අංක, 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**
**(අනුමත කළ දිනය: 1970 මාර්තු 24)**

1. මේ පනත 1970 අංක 16 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

2. මෙහි මින් මතු ''ප්‍රධාන පනත'' යනුවෙන් සඳහන් කරනු ලබන 1958 අංක. 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. එම වගන්තියේ (ඔ) ඡේදයෙහි:-

(අ) ''අඩු කළ යුතුය'' යන වචන වෙනුවට ''7අ වන වගන්තියෙහි විධිවිධානවලට යටත්ව අඩු කළ යුතුය.'' යන වචන අදේශ කිරීමෙන්; සහ

(ආ) ''මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදීමේදී'' යන වචන වෙනුවට ''මේ පනත යටතේ පිළිවෙලින් ඔවුන්ට අයත් කටයුතු කිරීමේදී'' යන වචන අදේශ කිරීමෙන් වේ.

3. ප්‍රධාන පනතෙහි 7 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 7 අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

7අ. මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේදී කොමසාරිස්ට දරන්නට සිදුවන වියදම් ලංකාවේ ඒකාබද්ධ අරමුදල කෙරෙහි වැය බරක් විය යුතුය:

එසේ වුවද මේ පනතෙහි v වන කොටසෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදවීමෙහිදී කොමසාරිස්ට දරන්නට සිදුවන වියදම් අරමුදලෙහි මුදල් අයෝජනය කිරීමෙන් ලැබෙන ආදයමෙන් ගෙවිය යුතුය.''

4. ප්‍රධාන පනතෙහි 14 වන වගන්තිය, එහි (1) වන උප වගන්තිය සංශෝධනය කිරීමෙන්, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ උප වගන්තියේ අතුරු විධිවිධානයෙහි (අ) හා (ආ) ඡේද අත්හැරීමෙන්;

(2) එම අතුරු විධානයෙහි (ඇ) හා (ඈ) ඡේදවලට එහි (අ) හා (ආ) ඡේද වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් සහ;

(3) එම අතුරු විධානයෙහි නැවත අක්ෂර යෙදූ (අ) ඡේදයෙහි;

(i) ''සියයට දෙකහමාර ගණනේ පොලී'' යන වචන වෙනුවට ''සියයට දෙක-හමාරට නො අඩු ගණනක් බැගින් පොලී'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) ''අවසාන වන දිනයේදී'' යන වචන වෙනුවට ''අවසාන වන දිනයට පෙරාතුවම වූ මාසය අගදී'' යන වචන ආදේශ කිරීමෙන් ද වේ.

## 1970 අංක 26 දරණ බදු මගහැරීම වැළැක්වීමේ පණත.

**ආදායම් බදු ලබා ගැනීම සඳහා විශේෂ ක්‍රම යොදා ගැනීමට හැකි කරවීම පිණිස ද බදු මග හැරීමෙන් ආදායමට සිදුවන පාඩුව වැලැක්වීම පිණිස ද එවැනි විශේෂ ක්‍රම සම්බන්ධයෙන් හෝ ඒවාට ආනුෂංගික ව මුදල් නීති පනතෙහි වෙනස් කිරීම ඇති කිරීම පිණිස ද වූ පනතකි.**

**(අනුමත කළ දිනය: 1970 නොවැම්බර් 1)**

ආදායම් බදු මග හැරීම බරපතළ ලෙස හා බහුල ලෙය සිදු වී ඇති හෙයින් ද:

එසේ මග හැරීමේ මාර්ගයක් වශයෙන් ලොකු වර්ගීය අගයෙන් යුත් මුදල් නෝට්ටු සඟවා රැස් කර තැබීම බොහෝ සෙයින් කරනු ලබන හෙයින් ද:

එසේ මගහරිනු ලබන බදු ලබා ගැනීම සඳහා අප්‍රමාද ව පියවර ගැනීම අවස්ථානුකූල හෙයින් ද:

1. මේ පනත 1970 අංක 26 දරන බදු මගහැරීම වැළැක්වීමේ පනත යනුවෙන් සඳහන් කරනු ලැබිය හැකි ය.

2. 1970 ඔක්තෝබර් මස 26 වන දින සිට, එම දිනයට කලින් වූ දිනයක් දරන රුපියල් සියයේ හා රුපියල් පණහේ වර්ගීය අගයෙන් යුත්, මේ පනතෙහි මින් මතු "පරණ මුදල් නෝට්ටු" යනුවෙන් සඳහන් කරනු ලබන සියලුම මුදල් නෝට්ටු සම්බන්ධයෙන් මුදල් නීති පනතෙහි 55, 56 හා 57 වන වගන්තිවල විධිවිධාන අදාළවීම කෙළවර විය යුතු ය.

3. (1) සියලුම පරණ මුදල් නෝට්ටු, වලංගු මුදල් ව පැවතීම, 1970 නොවැම්බර් මස 3 වන දින කෙළවර විය යුතු අතර මේ පනත මගින් ප්‍රකාශිත වම අන් ආකාරයක විධිවිධාන සලස්වා ඇති පරිදි හැර ඒ මුදල් නෝට්ටු සම්බන්ධයෙන් මහා බැංකුවෙ වගකීම කෙළවර විය යුතු ය. තවද ඒ අනු ව එවැනි යම් මුදල් නෝට්ටුවක් සතු ව සිටින්නා යම් වන්දියක් ලැබීමට හිමිකම් නො ලැබිය යුතුය.

(2) (4) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත් ව, 1970 නොවැම්බර් මස 25 වන දින ඇතුළත් ව ඒ දින වන තුරු, තමාට අයත් පරණ මුදල් නෝට්ටු කිසිවක් සන්තකයෙහි ඇති තැනැත්තකු විසින්, මහා බැංකුව විසින් සපයනු ලැබිය හැකි ආකෘතියක තමා විසින් පිළියෙල කොට අත්සන් කරන ලද, අනු පිටපතක් සහිත ලිඛිත ප්‍රකාශයක් මුදල් නෝට්ටු භාර දෙන වේලාවෙහි දී ඉදිරිපත් කරතහොත් සහ එසේ කරතහොත් පමණක් ඒ නෝට්ටු යම් උප ලේඛනගත බැංකුවක් වෙත භාර දිය හැකි ය; නැතහොත් එසේ භාරදීමට සැලැස් විය හැකි ය. එසේ භාර දෙනු ලබන නෝට්ටු මහා බැංකුවේ නියෝජිතයා වශයෙන් පිළිගැනීමට ඒ බැංකුවට මෙයින් බලය පවරා නියම කරනු ලැබේ.

(3) යම් තැනැත්තකු 1970 නොවැම්බර් මස 2 වන දින හෝ ඊට පෙර යම් උපලේඛන ගත බැංකුවක් වෙත (2) වන උපවගන්තිය යටතේ පරණ මුදල් නෝට්ටු භාර දෙන ලද අවස්ථාවක, ඒ බැංකුව විසින්-

(අ) එසේ භාර දෙන ලද පරණ මුදල් නෝට්ටුවල වටිනාකම රුපියල් එක් දහසකට වැඩි නොවේ නම්, එසේ භාර දෙන ලද නෝට්ටුවල වටිනාකම ඒ තැනැත්තාට ගෙවිය යුතු අතර ඒ ගෙවීම, හැකි තාක් දුරට, එසේ භාර දෙන ලද පරණ මුදල් නෝට්ටුවල වර්ගීය අගයෙන් ම යුත් නෝට්ටු වලින් කළ යුතු ය; නැතහොත්

(ආ) එසේ භාර දෙන ලද පරණ නෝට්ටුවල වටිනාකම රුපියල් එක් දහසකට වැඩි වේ නම්, ඒ තැනැත්තාට රුපියල් එක් දහසකට නො වැඩි මුදලක් ගෙවිය යුතු අතර ඒ ගෙවීම, හැකිතාක් දුරට, එසේ භාර දෙන ලද පරණ මුදල් නෝට්ටුවල වර්ගීය අගයෙන් ම යුත් නෝට්ටුවලින් කළ යුතුය. තව ද එසේ භාර දෙන ලද නෝට්ටුවල ඉතුරු වටිනාකම ඒ තැනැත්තාගේ බැරට එම බැංකුවෙහි තැන්පත් කරනු ලැබූ ලෙස තබා ගත යුතු ය.

(4) 1970 නොවැම්බර් මස 3 වන දින ආරම්භ ව 1970 නොවැම්බර් මස 25 වන දින අවසන් වන කාලසීමාව ඇතුළත යම් තැනැත්තකු විසින් (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන පරණ මුදල් නෝට්ටු භාරදීමක්:-

(අ) එක් උපලේඛනගත බැංකුවක පමණක් ඒ තැනැත්තාට ගිණුමක් ඇතහොත්, එම බැංකුවට කළ යුතු ය; නැතහොත්

(ආ) එවැනි බැංකු එකකට වැඩි ගණනක ඒ තැනැත්තාට ගිණුමක් ඇතහොත් තමා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ඉන් එක් බැංකුවකට පමණක් කළ යුතු ය.

(5) යම් තැනැත්තකු විසින් (2) හා (4) වන උපවගන්තිවල විධිවිධාන අනුව යම් උපලේඛනගත බැංකුවකට පරණ මුදල් නෝට්ටු භාරදුන් අවස්ථාවක, ඒ බැංකුව විසින් ඒ නෝට්ටුවල වටිනාකමට සමාන මුදලක් ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය.

(6) 1970 නොවැම්බර් මස 3 වන දින ආරම්භ ව 1970 නොවැම්බර් මස 25 වන දින අවසන් වන කාලපරිච්ඡේදය තුළ යම් තැනැත්තකු විසින් තමාගේ ගිණුමක් නැති උපලේඛනගත යම් බැංකුවකට (2) වන උපවගන්තිය යටතේ පරණ මුදල් නෝට්ටු භාර දුන් අවස්ථාවක, ඒ බැංකුව විසින් ඒ නෝට්ටුවල වටිනාකම ඒ තැනැත්තාගේ බැරට තැන්පත් කරනු ලැබූ ලෙස තබා ගත යුතු ය.

(7) යම් උපලේඛනගත බැංකුවකට මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ භාරදෙන ලද පරණ මුදල් නෝට්ටු සියල්ල ම හෝ කොටසක් ඒ නෝට්ටු භාරදෙනු ලැබුවේ යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තාට අයත් නොවන බවට ඒ බැංකුවට යම් සැකයක් ඇති වුවහොත් ඒ බැංකුව විසින්, එසේ භාර දෙන ලද මුදල් නෝට්ටු ඒ තැනැත්තාට අයත් බවට බැංකුව සෑහීමට පත් වන තුරු ඒ භාරදීම සම්බන්ධයෙන් ඒ විධිවිධාන යටතේ කිරීමට ඒ බැංකුවට නියම විය හැකි යම් ගෙවීමක් ඒ බැංකුව විසින් අත් හිටුවා ගත හැකි ය.

4. 3 වන වගන්තියෙන් නියමිත ප්‍රකාශයේ පිටපත් දෙකක් සමග ඒ වගන්තිය යටතේ පරණ මුදල් නෝට්ටු භාරදෙනු ලැබූ උපලේඛන ගත යම් බැංකුවක් විසින් ඒ එක් ප්‍රකාශයක් දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවිය යුතු අතර ඒ අනික් ප්‍රකාශය බැංකුව සන්තකයෙහි තබා ගත යුතු ය.

5. උපලේඛනගත යම් බැංකුවක් වෙත මේ පනතේ විධිවිධාන යටතේ පරණ මුදල් නෝට්ටු භාරදෙන ලද යම් තැනැත්තකු විසින්, 1965 අප්‍රේල් මස 1 වන දින ආරම්භව 1970 මාර්තු මස 31 වන දින අවසන් වන තක්සේරු වර්ෂ තුළ ආදායම් බදු හෝ වෙන යම් බද්දක් ගෙවීම පිළිබඳ යම් මගහැරීමක් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස්ට ප්‍රකාශයක් කළ හැකි ය.

6. (1) දේශීය ආදායම් කොමසාරිස් විසින්, 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලද යම් තැනැත්තකු හා ඒ ප්‍රකාශය ද පරීක්ෂා කිරීම හෝ දේශීය ආදායම් පනත යටතේ තමා විසින් පත් කරනු ලබන යම් නිලධාරියකු විසින් පරීක්ෂා කිරීමට සැළැස්වීම කළ යුතු අතර ඒ තැනැත්තා විසින් ඒ පනතේ කාර්යයන් සඳහා ප්‍රකාශ කරන ලද ආදායම සම්බන්ධයෙන් සියයට 33⅓ ප්‍රමාණයට සමාන බද්දක් පැනවිය යුතු ය:

එසේ වුව ද එසේ පනවනු ලැබූ බදු මුදල ඒ තැනැත්තා විසින් භාරදෙන ලද පරණ මුදල් නෝට්ටුවල නෝට්ටුවල වටිනාකමින් සියයට 50 ප්‍රමාණයට අඩු වන අවස්ථාවක, එසේ පනවනු ලබන බද්ද ඒ තැනැත්තා භාරදෙන ලද පරණ මුදල් නෝට්ටුවල වටිනාකමින් සියයට 50 විය යුතු ය:

එසේ ම තව දුරටත් 1965 අප්‍රේල් 1 වන දින ආරම්භ ව 1970 මාර්තු 31 වෙනි දින අවසන් වන කාලපරිච්ඡේදය තුළ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ආදායම් බද්දට තමා යටත් බව ඒ පනතේ 81 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් තක්සේරු කරුවකු වෙත දැන්වීමක් නො දෙන ලද අවස්ථාවක හෝ ඒ කාලපරිච්ඡේද තුළ තක්සේරු වර්ෂ සම්බන්ධයෙන් ආදායම් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස තක්සේරු කරුවකු විසින් ඒ තැනැත්තාට නියම නො කරන ලද අවස්ථාවක-

(අ) ඒ කාලපරිච්ඡේදය තුළ ඔහුගේ මුළු ආදායමින් සියයට 33⅓ බැගින් වූ බද්දක් පැනවිය යුතු ය; හෝ

(ආ) (අ) ඡේදය යටතේ ගණන් බලනු ලැබූ බදු මුදල ඒ තැනැත්තා විසින් භාර දෙන ලද පරණ මුදල් නෝට්ටුවල වටිනාකමින් සියයට 50 ප්‍රමාණයට අඩු වුවහොත් ඒ තැනැත්තා විසින් භාර දෙන ලද පරණ මුදල් නෝට්ටුවල වටිනාකමින් සියයට 50 ප්‍රමාණයට සමාන බද්දක් ඒ තැනැත්තා සම්බන්ධයෙන් පැනවිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ බද්දක් පැනවීමේ හා අයකර ගැනීමේ කාර්යයන් සඳහා ආදායම් බදු තක්සේරු කිරීමට හා අයකර ගැනීමට අදාළ දේශීය ආදායම් පනතේ විධිවිධාන හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

(3) මේ පනත ආරම්භවීමේ දිනයට පෙරාතුව යම් තැනැත්තකු විසින් ආදායම් පිළිබඳ වැරදි වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති බව විශ්වාස කිරීමට තරම් හේතු තක්සේරු කරුවකුට තිබී ඒ වාර්තාවෙන් පැන නගින කරුණු සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ වී ඇතහොත් හෝ 5 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයෙහි මෙවැනි ආයෝජන සම්බන්ධයෙන් ගෙවන ලද කවර හෝ ආදායමක් අඩංගු වේ නම්. (1) වන උපවගන්තියේ විධිවිධාන ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ නො විය යුතු ය.

7. මේ පනත යටතේ යම් උපලේඛනගත බැංකුවක් විසින් යම් තැනැත්තකුගේ බැරට යම් මුදලක් තැන්පත් කරනු ලැබූ ලෙස තබා ගන්නා ලද අවස්ථාවක, ඒ තැන්පත් කිරීම කරනු ලැබූ දිනයෙන් පසු, වැඩ කරන සම්පූර්ණ දින තුනක් ගත වන තුරු ඒ මුදල සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් ඉවත් කර ගැනීමට බැංකුව විසින් ඒ තැනැත්තාට ඉඩ නොදිය යුතු ය.

8. මේ පනත යටතේ යම් තැනැත්තකුගේ බැරට යම් උපලේඛන ගත බැංකුවක තැන්පත් කරනු ලැබූ ලෙස තබා ගනු ලැබූ යම් මුදලක් ගෙවීම 7 වන වගන්තියෙහි විධිවිධාන වලට අනුකූල ව නො වන අන් ආකාරයකින් අත්හිටුවා ගත් හෝ ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක, එසේ තැන්පත් කරනු ලැබූ ලෙස තබා ගත් මුදල ලබා ගැනීම සඳහා ඇටෝර්නි ජනරාල්ට විරුද්ධ ව ඒ තැනැත්තා විසින් නඩුවක් පැවරිය හැකි අතර, එවැනි යම් නඩුවක දී, ඒ තැන්පත් කිරීම හා සම්බන්ධ, මේ පනත යටතේ භාර දෙන ලද මුදල් නෝට්ටු ඒ තැනැත්තාට අයත් බව ඔප්පු කිරීමේ භාරය පැමිණිලිකරු කෙරෙහි විය යුතු ය. ඒ තැනැත්තාට ඒ තැන්පත් කිරීමේ මුදල අය කරගැනීම පිණිස නඩු පැවරීමක් හෝ ඉල්ලීමක් හෝ රිට් ආඥා පත්‍රයක් මගින් කිසිම උසාවියක දී අන් කිසි ප්‍රතිකර්මයකට හිමිකම නො තිබිය යුතු ය.

9. උපලේඛනගත යම් බැංකුවක යම් නිලධරයකු විසින් හෝ අන් කිසි තැනැත්තකු විසින් මේ පනතෙහි විධිවිධාන යටතේ කරන ලද යම් ක්‍රියාවකින් හෝ දෙයකින් උද්ගත ව හෝ ඒ ක්‍රියාව හෝ දෙය සම්බන්ධයෙන් ඒ නිලධරයාට හෝ අන් තැනැත්තාට විරුද්ධ ව

යම් උසාවියක පවරන ලද නඩුවක දී හෝ වෙනත් නීති කෘත්‍යයක, දී ඒ නඩුවෙහි දී නැතහොත් නීති කෘත්‍යයෙහි දී පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තුරු, ඒ ක්‍රියාව හෝ දෙය ඒ නිලධරයා හෝ අන් තැනැත්තන් විසින් නිත්‍යානුකූල ව කරන ලද සේ සැළකිය යුතු ය.

10. මේ පනතෙහි විධිවිධාන අතුරින් යම් විධිවිධානයකින් පැන නගින බැඳීම් වලින් යම් තැනැත්තකු හෝ අයතනයක් සාමාන්‍ය හෝ විශේෂ ආඥාවක් මගින් නිදහස් කිරීමට මහා බැංකුවට මෙයින් බලය දී බලය පවරනු ලැබේ.

11. (අ) මේ පනත යටතේ අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන. හෝ එබඳු යම් ප්‍රකාශයක් කිරීමට වෙනයම් තැනැත්තකුට ආධාර කරන හෝ අනුබල දෙන; හෝ

(ආ) මේ පනත යටතේ යම් බලයක්, යුතුකමක් හෝ කාර්යයක් පාවිච්චි කිරීමේ දී, ඉටු කිරීමේ දී හෝ කිරීමේ දී උපලේඛනගත යම් බැංකුවක යම් නිලධරයකුට හෝ වෙනයම් තැනැත්තකුට බාධා කරන හෝ එසේ බාධා කිරීමට වෙනයම් තැනැත්තකුට ආධාර කරන හෝ අනුබල දෙන; හෝ

(ඇ) 3 වන වගන්තියේ (4) වන උප වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින; හෝ ඒ විධිවිධාන කඩ කිරීමට වෙනයම් තැනැත්තකුට ආධාර කරන හෝ අනුබල දෙන හෝ;

(ඈ) 12 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරනු ලැබූ යම් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට යටත් විය යුතු ය.

12. මේ පනතේ විධිවිධාන ඵලදායි ලෙස බලපැවැත්වීම හැකි කරවීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු තොරතුරු විධානයෙහි නිශ්චිත ව සඳහන් කළ යුතු යම් කාල-පරිච්ඡේදයක් ඇතුළත මහා බැංකුව වෙත සපයන ලෙස වෙන යම් උපලේඛනගත බැංකුවකට මහා බැංකුව විසින් කලින් කල නියම කළ හැකි අතර ඒ විධානය අනුව ක්‍රියා කිරීම ඒ අනින් බැංකුවේ කළමනාකරුගේ යුතුකම විය යුතු ය.

13. මහ බැංකුව උපලේඛනගත බැංකුවක් වශයෙන් සලකනු ලැබුවද මෙම පනත යටතේ තැන්පතු භාරගැනීමට හෝ පවත්වා ගැනීමට මහ බැංකුව බැඳී සිටිය යුතු නොවේ.

14. මේ පනතේ විධිවිධාන 1970 ඔක්තෝබර් මස 26 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය.

15. මේ පනතෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"මහා බැංකුව" යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහා බැංකුව අදහස් වේ; සහ

"උපලේඛනගත බැංකුව" යන්නෙන් මහා බැංකුව හෝ මුදල් නීති පනතේ අර්ථානුකූල වූ වෙනයම් වාණිජ බැංකුවක්, හෝ ලංකා ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ.

## 1970 අංක 27 දරන බැංකු හර බදු පනත

**වාණිජ බැංකුවල ජංගම ගිණුම්වලින් කරනු ලබන හර වෙනුවෙන් බද්දක් පැනවීම පිණිසත් එයට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.**

(අනුමත කළ දිනය: 1970 නොවැම්බර් 1)

1. මේ පනත 1970 අංක 27 දරන බැංකු හර බදු පනත යනුවෙන් සඳහන් කරනු ලැබිය හැකි අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

2. (1) 3 වන වගන්තියෙහි විධිවිධානවලට යටත් ව, එක් එක් ජංගම ගිණුමෙන් එක් එක් ලිත් මාසය තුළ කරනු ලබන හරවල මුළු මුදල වෙනුවෙන් ඒ මුදලෙහි සියයට එකෙන් දහයෙන් පංගුවක් වූ ප්‍රමාණය අනුව හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරනු ලබන යෝජනාවකින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් ප්‍රමාණයක් අනුව බද්දක් අය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් හෝ යටතේ පනවනු ලබන බද්දක් මේ පනතෙහි මින් මතු බද්ද යනුවෙන් සඳහන් කරනු ලැබේ.

3. ජංගම ගිණුම්වලින් කරනු ලබන පහත සඳහන් හර බද්දෙන් නිදහස් විය යුතු ය:-

(අ) ලංකා රජයේ, යම් විදේශීය රජයක, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් විශේෂඥිත නියෝජ්‍යත්වයක, දකුණු හා අග්නිදිග ආසියාවේ කාර්මික සහයෝගතා මණ්ඩලයේ, හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් ඇමතිවරයා විසින් අනුමත කරනු ලබන යම් අන්තර් ජාතික හෝ විදේශීය ආයතනයක යම් ජංගම ගිණුමකින් කරනු ලබන හර;

(ආ) වාණිජ බැංකුවක ලංකාවේ යම් ශාඛාවක පවත්වා ගෙන යනු ලබන එම බැංකුවේ ලංකාවේ ප්‍රධාන කාර්යාලයේ යම් ජංගම ගිණුමකින් කරනු ලබන හර;

(ඇ) වාණිජ බැංකුවක ලංකාවේ ප්‍රධාන කාර්යාලයෙහි පවත්වා ගෙන යනු ලබන එම බැංකුවේ ලංකාවේ ශාඛාවක යම් ජංගම ගිණුමකින් කරනු ලබන හර;

(ඈ) වාණිජ බැංකුවක ලංකාවේ යම් ශාඛාවක පවත්වාගෙන යනු ලබන එම බැංකුවේ ලංකාවේ අන් කිසි ශාඛාවක යම් ජංගම ගිණුමකින් කරනු ලබන හර;

(ඉ) බද්ද ගෙවීම සඳහා ජංගම ගිණුමකින් ඉවත් කරගනු ලබන මුදල් සම්බන්ධයෙන් ඒ ජංගම ගිණුමෙන් කරනු ලබන හර;

(ඊ) විශේෂ ජංගම ගිණුමක් ආරම්භ කිරීමේ කාර්යය සඳහා ජංගම ගිණුමකින් ඉවත් කර ගනු ලබන හා ඒ විශේෂ ජංගම ගිණුමට බැර කරනු ලබන මුදල් කිසිවක් සම්බන්ධයෙන් ඒ ජංගම ගිණුමෙන් කරනු ලබන හර;

(උ) විශේෂ ජංගම ගිණුමකින් කරනු ලබන හර; සහ

(ඌ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් මුදල් ඇමතිවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ජංගම ගිණුම්වලින් කරනු ලබන වෙනත් හර හෝ වෙනත් පංතිවලට අයත් හර.

4. යම් තැනැත්තකුගේ ජංගම ගිණුමකින් යම් ලිත් මාසයක් තුළ කරනු ලබන හර වෙනුවෙන් වූ බද්ද ගෙවීමට බැඳී සිටීම එම මාසය අවසානයේ දී ආරම්භ විය යුතු අතර ඔහු බද්ද ගෙවීමට බැඳී සිටිය යුතු ය.

5. (1) සෑම වාණිජ බැංකුවක් විසින් එක් එක් ලිත් මාසය අවසාන වීමෙන් පසු දින තිහක් ඇතුළත, එම බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන එක් එක් ජංගම ගිණුමෙහි ඇති මුදල අනුව එම මාසය තුළ එම ගිණුමෙන් කරනු ලැබූ හර වෙනුවෙන් වූ බද්දට හෝ බද්දෙහි කොටසට සමාන මුදලක් එම ගිණුමෙන් ඉවත් කර ගත යුතු ය; ඉනික්බිති, මේ උපවගන්තිය ප්‍රකාර ඉවත් කර ගන්නා ලද මුලු මුදලින් 6 වන වගන්තියෙහි සඳහන් ගාස්තු වෙහි මුදල අඩු කර ගැනීමෙන් පසු ඒ මුළු මුදලෙහි ඉතුරුව නියමිත ආකෘතියෙහි පිළියෙළ කළ එයට අදාළ ප්‍රකාශයකුත් සමග, ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ගණකාධිකාරී වෙත යැවිය යුතු ය.

(2) බද්ද ගෙවීම් වශයෙන් ජංගම ගිණුමකින් (1) වන උපවගන්තිය යටතේ යම් මුදලක් ඉවත් කොට යවනු ලැබූ අවස්ථාවක ඒ ගෙවීම එම ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තකු සඳහා ද ඒ තැනැත්තාගේ බලය ඇති ව කරන ලද සේ සැලකිය යුතු අතර, එසේ යවනු ලැබූ බද්දෙහි මුදල ගෙවීමට ඔහුගේ බැඳී සිටීම වලංගු ලෙස ඉටු කිරීමක් විය යුතු ය.

(3) යම් ජංගම ගිණුමක් පවත්වාගෙන යන වාණිජ බැංකුව යම් ලිත් මාසයක් තුළ එම ගිණුමෙන් කරන ලද හර වෙනුවෙන් වූ බද්ද හෝ බද්දෙහි යම් කොටසක් ලබා ගැනීමට ඒ ගිණුමෙහි මුදල් නො මැතිවීම නිසා හෝ එහි මුදල් ප්‍රමාණවත් නො වීම නිසා අපොහොසත් වන අවස්ථාවක, එම ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තකු සඳහා ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ද එම ගිණුම සම්බන්ධයෙන් ලබා නො ගන්නා ලද බද්දෙහි මුදල ද ලබා නො ගන්නා ලද බද්ද අය විය යුත්තේ යම් හර සම්බන්ධයෙන් ද ඒ හරවල මුදල ද (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශය යවන විට එම බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත නියමිත ආකෘතියෙහි වාර්තා කළ යුතු ය.

(4) යම් ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තකු සඳහා ද ඒ තැනැත්තා විසින් යම් ගෙවීමක් කරන ලෙස චෙක්පතක්, අණකරයක්, ඇණවුමක් හෝ වෙනත් උපදෙස් දීමක් මගින් ඉල්ලා සිටි විට ඒ ගිණුමෙන් කරන ලද හර වෙනුවෙන් වූ බද්ද හෝ බද්දෙහි යම් කොටසක් ගෙවීමට ඇතැයි යන හේතුව පිට එම ගෙවීමෙහි සම්පූර්ණ මුදල හෝ ඒ කොටස ඒ ජංගම ගිණුමෙහි මුදල්වලින් ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට වාණිජ බැංකුවට බලය දෙන්නක් ලෙස මේ වගන්තියෙහි පෙරාතුව වූ විධිවිධානවල කිසිවක් නො සැලකිය යුතු ය.

6. සෑම වාණිජ බැංකුවක් විසින්, බද්ද ලබා ගැනීමේ හා යැවීමේ වියදම් වශයෙන්, යම් ලිත් මාසයක් සම්බන්ධයෙන් බද්ද ගෙවීම් වශයෙන් ලබා ගන්නා ලද මුළු මුදලින්, නියම කරනු ලැබිය හැකි ගාස්තුවක් අඩු කොට තබා ගත හැකි ය.

7. යම් තැනැත්තකුගේ ජංගම ගිණුමෙන් යම් ලිත් මාසයක් තුළ කරන ලද හර වෙනුවෙන් අය විය යුතු බද්දෙහි යම් මුදලක් ලබා ගැනීමට බැංකුව අපොහොසත් බව වාණිජ බැංකුවක් විසින් 5 වන වගන්තියේ (13) වන උපවගන්තිය යටතේ වාර්තා කරනු ලැබූ අවස්ථාවක, තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් බලය පවරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු විසින්, එම මුදල ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු පිණිස නියමයෙහි දිනයේ සිට දින දහහතරක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවන ලෙස ලියවිල්ලකින් ඒ තැනැත්තාට නියම කළ හැකි ය. ඒ දින දහහතර ඇතුළත එම මුදල ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමට ඒ තැනැත්තා අපොහොසත් වුවහොත් ඒ මුදල ගෙවීම පැහැර හැර ඇතැයි සැලකිය යුතු අතර එය ඔහුගේ සියලු වත්කම්වලින් අය විය යුත්තක් විය යුතු ය.

8. යම් මුදලක් සම්බන්ධයෙන් බද්ද ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් ඒ මුදල පිළිබඳ විස්තර සහ ගෙවීම පැහැර හරින ලද තැනැත්තාගේ නම හා අන්තිමට දන්න සිටි පදිංචි ස්ථානය හෝ ව්‍යාපාරස්ථානය සම්බන්ධ විස්තර අඩංගු සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාශය තුළ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ හැකි ය. එසේ කරනු ලැබූ විට මහෙස්ත්‍රාත්වරයා විසින්, පැහැර හරිනු ලැබ බද්දු මුදල අය කර ගැනීම සඳහා ඒ ගෙවීම පැහැර හරින ලද තැනැත්තාට විරුද්ධව නීති කෘත්‍ය නො පැවරිය යුත්තේ මන් ද යන බවට හේතු දක්වනු පිණිස ඒ තැනැත්තා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු නො දක්වන ලද්දේ නම්, ගෙවීම පැහැර හරිනු ලැබූ බද්දු මුදල ඒ ගෙවීම පැහැර ;හරින ලද තැනැත්තා වෙත මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක ආකාරයෙන් මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවකින් අය කර ගත යුතු ය. එසේ අය කර ගනු ලැබූ විට ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු පිණිස එය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත යැවිය යුතු ය.

9. (1) යම් මුදලක් 3 වන වගන්තියෙන් හෝ එය යටතේ බද්දෙන් නිදහස් කරනු ලැබූ භර කිසිවක් වෙනුවෙන් වූ බද්ද වශයෙන් යම් තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් ගෙවන ලද හෝ යම් තැනැත්තකුගෙන් අය කර ගනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ලියවිල්ලකින් වූ හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ මුදල ආපසු ගෙවනු ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට ගෙවියයුතු යම් මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු ය.

10. (1) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලබන ඒ බැංකුවේ යම් නිලධරයකු විසින් මේ පනතේ කාර්‍ය්‍යයන් සඳහා අවශ්‍ය විය හැකි යම් වාරවාර්තා සපයන ලෙස වාණිජ බැංකුවලට විධාන කළ හැකි අතර, ඒ බැංකු මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරයි ද යන වග නිශ්චිත ව දැන ගැනීම පිණිස ඒ බැංකු වල තබනු ලබන පොත්වල, වාර්තාවල හා වෙනත් ලේඛනවල යම් සටහනක් පරීක්ෂා කිරීම හා ඒවායේ පිටපත් ගැනීම ඔහු විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් විධානයක් අනු ව සෑම වාණිජ බැංකුවක් විසින් ම ක්‍රියා කළ යුතු අතර එබඳු බැංකුවල තබනු ලබන යම් පොත්වල වාර්තාවල හෝ වෙනත් ලේඛනවල යම් සටහන් පරීක්ෂා කිරීමට හා ඒවායේ පිටපත් ගැනීමට (1) වන උපවගන්තියෙන් බලය ලත් යම් තැනැත්තකුට, එසේ කිරීමට අවසර දීම හා සහාය දීම කළ යුතු ය.

(3) රහස්‍යතාව, පවත්වා ගැනීමේ යුතුකමට අදාළ මුදල් නීති පනතේ 45 වන වගන්තිය, (1) වන උපවගන්තිය යටතේ තම බලතල පාවිච්චි කිරීමෙහි දී ඒ උප වගන්තියෙහි සඳහන් ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකුට දැන ගැනීමට ලැබෙන කරුණු සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

11. යම් තැනැත්තකු සඳහා වාණිජ බැංකුවක් විසින් විශේෂ ජංගම ගිණුමක් ආරම්භ කළ හැකිය. එහෙත් මේ පනතෙහි අර්ථානුකූල ව එය විශේෂ ජංගම ගිණුමක් වීමට නම් ජංගම ගිණුමක් අවශ්‍ය කාර්යය සඳහා පමණක් තමාට විශේෂ ජංගම ගිණුමක් අවශ්‍ය බව ඒ තැනැත්තා ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.

12. (1) විශේෂ ජංගම ගිණුමක් ආරම්භ කිරීමේ කාර්‍ය්‍යය සඳහා වාණිජ බැංකුවකට අසත්‍ය ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත් වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නො වැඩි දඩයකට හෝ අවුරුද්දකට නො වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දෙකට ම යටත් විය යුතු ය.

(2) විශේෂ ජංගම ගිණුමක් ආරම්භ කිරීම සඳහා අසත්‍ය ප්‍රකාශයක් කිරීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට උසාවිය විසින් වෙන යම් දණ්ඩන නියමයකට අතිරේක ව, ඒ ගිණුම විශේෂ ජංගම ගිණුමක් නොව ජංගම ගිණුමක් වූයේ නම් ඒ ගිණුමෙන් කරනු ලැබූ හර වෙනුවෙන් ගෙවිය යුතුව තුබූ බද්ද වශයෙන් උසාවිය විසින් තීරණය කළ හැකි යම් මුදලක් ගෙවන ලෙස ඔහුට ආඥා කළ යුතු අතර, ඒ ගිණුම පවත්වා ගෙන යන වාණිජ බැංකුවට ඒ ගිණුම වසා දමන ලෙස ආඥා කළ යුතු ය. ඒ බැංකුව විසින් ඒ ආඥාව අනු ව ක්‍රියා කළ යුතු ය. මේ උප වගන්තිය යටතේ ගෙවන ලෙස ආඥා කරනු ලැබූ යම් මුදලක් එම උසාවිය විසින් පනවනු ලැබූ දඩයක් ලෙස උසාවියේ ආඥාවකින් අය කර ගත හැකි අතර එය එසේ අය කර ගනු ලැබූ විට ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත යැවිය යුතු ය.

(13) යම් වාණිජ බැංකුවක පවත්වා ගෙන යනු ලබන යම් විශේෂ ජංගම ගිණුමක් ඇත්ත වශයෙන් ම එබඳු ගිණුමක් නො වන බවට මුදල් ඇමතිවරයා සෑහීමට පත් වූ අවස්ථාව ඔහු විසින් ඒ ගිණුම වසා දමන ලෙස ඒ බැංකුවට ලියවිල්ලකින් ආඥා කළ හැකි අතර ඒ බැංකුව විසින් ඒ ආඥාව අනුව ක්‍රියා කළ යුතු ය.

14. යම් වාණිජ බැංකුවක් මේ පනතේ යම් විධිවිධාන අනු ව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ඒ විධිවිධාන කඩ කරන අවස්ථාවක ඒ බැංකුවේ කළමනාකරු හෝ සෙසු ප්‍රධාන විධායක නිලධරයා වරදකට නඩු විසඳීමකින් වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩුවිසඳීමකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසකට නො වැඩි දඩයකට හෝ මාස හයකට නො වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

15. සැම ලිත් මාස තුනක් අවසානයේ දී, ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ එම බැංකුවේ නිලධරයකු විසින්, එක් එක් වාණිජ බැංකුව සම්බන්ධයෙන්, එම වාණිජ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම්වලින් එකී මාස තුනේ කාලය තුළ කරනු ලබන්නා වූ බද්දට යටත් හරවල සම්පූර්ණ මුදල, ඒ හරවලින් අය කළ යුතු සම්පූර්ණ බදු ප්‍රමාණය, බද්ද ගෙවීම් වශයෙන් ඒ වාණිජ බැංකුව විසින් යවන ලද මුදල් ප්‍රමාණය, බද්ද ලබා ගැනීම හා යැවීම සඳහා බැංකුවේ ගාස්තුව වශයෙන් ඒ වාණිජ බැංකුව විසින් තබා ගන්නා ලද මුදල් ප්‍රමාණය සහ ලබා නො ගන්නා ලද යම් බදු ප්‍රමාණයක් තිබේ නම් ඒ බදු ප්‍රමාණය ද පිළිබඳ ලිඛිත සහතිකයක් ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. එම සහතිකය අදාළ වන ලිත් මාස තුන අවසන් වූ දින හතළිස් හතරක් ඇතුළත දී එකී අධිපති විසින් එකී සහතිකය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත යැවිය යුතු ය.

එසේ වුව ද ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ සැම පළාත්බද ශාඛාවක් සම්බන්ධ-යෙන් ඒ සහතිකය ඒ ශාඛාවෙහි කළමනාකරු ගේ අත්සන යටතේ විය යුතු අතර, ඒ කළමනාකරු විසින් ඒ සහතිකය එහි පිටපතක් ද සමග ඒ සහතිකය අදාළ වන ලිත් මාස තුන අවසාන වීමෙන් පසු දවස් තිහක් ගතවීමට පෙර එකී පාලක වෙත යැවිය යුතු ය.

මේ වගන්තියෙහි ''පළාත්බද ශාඛාව'' යන්නෙන් ලංකාවෙහි සහ කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමා තුළ ප්‍රදේශයෙන් පිටත පිහිටියා වූ ශාඛාවක් අදහස් වේ.

16. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මුදල් ඇමතිවරයා විසින් නියෝග පැන විය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල සාමාන්‍යත්වයට හානියක් නො වන පරිදි, නියම කළ යුතු ය යි මේ පනතේ සඳහන් හෝ මේ පනතින් නියමිත යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග පැනවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ පනවනු ලබන යම් නියෝග ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් එම නියෝගවල සඳහන් දින සිට ක්‍රියාත්මක විය යුතු ය. එවැනි දිනයක් එසේ නිශ්චිත ව සඳහන් කර නැතහොත් ගැසට් නිවේදනය පළ වූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ පනවනු ලැබ පළ කරන ලද සෑම නියෝගයක් ම හැකි තාක් ඉක්මණින් උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුගාමී රැස්වීම් දෙකකදී උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හමුවෙහි තැබිය යුතු අතර, ඒ නියෝගය අනුමත කිරීම ප්‍රතික්ෂේප නො කළ යුතු යයි කියැවෙන යෝජනාවක් මගින්, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ තදනන්තර රැස්වීමට එම නියෝගය ඉදිරිපත් කළ යුතුය. උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ඒ නියෝගය අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඒ නියෝගය යටතේ එවකට කර ඇති යම් දෙයකට එයින්හානියක් නො වන පරිදි, එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ දින සිට ඒ නියෝගය අවලංගු වූ ලෙසසැලකිය යුතු ය. එසේ අනුමතිය ප්‍රතික්ෂේප කිරීමේ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම පනතෙහි—

''වාණිජ බැංකුව'' යන්නෙන්, මුදල් නීති පනතේ අර්ථානුකූල යම් වාණිජ බැංකුවක් අදහස් වන අතර, වාණිජ බැංකුවක ලංකාවේ පිහිටි සෑම ශාඛාවක් ම ඊට ඇතුළත් වේ;

''ජංගම ගිණුම'' යන්නෙන්—

(අ) යම් තැනැත්තකු සඳහා වාණිජ බැංකුවක පවත්වා ගෙන යනු ලබන්නා වූ ද, ඔහු විසින් දෙනු ලබන චෙක් පතක්, අණකරයක්, ඇණවුමක් හෝ වෙනත් උපදෙස් දීමක් අනුව මුදල් ගෙවීම කරනු ලබන්නා වූ ද, (ඉතිරි කිරීමේ ගිණුමක් හැර) බැර හෝ අන් කිසි ක්‍රමයක ගිණුමක්, සහ

(ආ) නිශ්චල දේපල යමක් මිළදී ගැනීම හෝ යම් ගොඩනැගිල්ලක් තැනීම වැනි මූල ධන ස්වභාවයක් දරණ වියදම් ද ඇතුළු ව යම් වාණිජ බැංකුවක් විසින් කරනු ලබන යම් වියදමක් සඳහා ගෙවීම් කරනු ලබන එම බැංකුවේ යම් අභ්‍යන්තර ගිණුමක් අදහස් වේ;

''හර'' යනුවෙන්, යම් තැනැත්තකුගේ ජංගම ගිණුමකින්, ඒ තැනැත්තා විසින් නිකුත් කරනු ලබන චෙක්පත්, අණකර, ඇණවුම් හෝ වෙනත් උපදෙස් දීමක් අනුව කරනු ලබන මුදල් ආපසු ගැනීම් සම්බන්ධයෙන් ඒ ජංගම ගිණුමෙහි කරනු ලබන සටහන් අදහස් වන අතර, වාණිජ බැංකුවක පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමකින් ඒ බැංකුව විසින් එහි ව්‍යාපාරික කටයුතුවල දී කරනු ලබන අය කිරීම් ද, ඊට ඇතුළත් වේ;

''ඉතිරි කිරීමේ ගිණුම'' යන්නෙන්, වාණිජ බැංකුවක පවත්වා ගෙන යනු ලබන්නා වූ ද තැන්පත් කළ මුදල් සඳහා පොලියක් එකතු වන්නා වූ ද, ඒ බැංකුව විසින් නියම කරනු ලබන කාලපරිච්ඡේදයකින් පසුව හෝ පනවනු ලබන රීතිවලට යටත් ව හෝ පමණක් ඒ ගිණුමින් මුදල් ඉවත් කර ගැනීම් කළ හැක්කා වූ ද ගිණුමක් අදහස් වේ;

''විශේෂ ජංගම ගිණුම'' යන්නෙන්, යම් තැනැත්තෙකු විසින්—

(අ) තම ව්‍යාපාරික කටයුතුවලදී තමාට ලැබෙන මුදල් අන් කිසි තැනැත්තන්ට ගෙවීම සඳහා ඒ අන් තැනැත්තන් සඳහා ඔවුන් වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමේ, සහ

(ආ) ඒ ගිණුමෙහි ඇති මුදල්වලින් ඒ තැනැත්තන්ට ගෙවීම් කිරීමේ කාර්යය සඳහා ම පමණක් පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමක් අදහස් වේ.

## (ආ) 1970 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධි විධාන

චක්‍රලේඛ අංක: 33/3

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1970 ජනවාරි 3 වන දින.

### වෙළෙඳ බැංකු ණය

1969 මැයි 12 වැනි දින හා අංක 33 දරන චක්‍රලේඛයේ හා 1969 ජුනි 13 වැනි දින හා අංක 31/1 දරන චක්‍රලේඛයේ විධිවිධාන 1970 අප්‍රේල් 30 වැනි දින තෙක් බල පැවැත්වෙන බව වෙළෙඳ බැංකුවලට මෙයින් දන්වනු ලැබේ.

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංක: 34

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1970 ජනවාරි මස 10 වන දින.

## අත්තිකාරම් සඳහා මහ බැංකු පොලී ප්‍රමාණයන්

(සම්බන්ධය : මුදල් නීති පණතේ 83 සහ 87 ඡේදයන්)

1. 1970 ජනවාරි මස 11 වන දින සිට, මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට දෙන, රජයේ ඇපවීම් සහ රජයේ වගකීම් සහිත සුරැකුම්වලින් සුරක්ෂිත වූ අත්තිකාරම් සඳහා පොලී ප්‍රමාණය වසරකට 6½% කි.

2. 1970 ජනවාරි මස 11 වන දින සිට, මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට දෙන වාණිජ සහ නිෂ්පාදන ණයවලට සම්බන්ධ භාවිත පොරොන්දු නෝට්ටුවලින් ඇපව සුරක්ෂිත වූ අත්තිකාරම් සඳහා පොලී ප්‍රමාණය වසරකට 6½% කි.

3. 1968 මැයි මස 5 වන දින චක්‍රලේඛ අංක: 26 මෙයින් ඉවත් කරගනු ලැබේ.

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංක: 35

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1970 ජනවාරි මස 10 වන දින.

## ප්‍රතිමූල්‍යෝජනය – මැදි හා දිගුකාලීන ණය සම්බන්ධ පොළී ප්‍රමාණයන්

මුදල් නීති පණතේ 88 අ (I) (ඇ) වගන්තිය (1963 අංක: II දරන මුදල් පණතේ 67 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි) සම්බන්ධවයි.

1970 ජනවාරි මස 11 වන දින සිට, මහ බැංකුව විසින් ණය දෙන ආයතන වෙත දී ඇති ප්‍රතිමූල්‍යෝජන ණයවල පොළී ප්‍රමාණයන් :-

(අ) ණය දෙන ආයතන විසින් කෘෂිකර්මය හෝ කර්මාන්ත නගා සිටුවීම හෝ සංවර්ධනය සඳහා තම ගණුදෙනුකරුවනට දෙනු ලබන; මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍යෝජනයක් පතන, ණයවලට, එම පහසුකම් සපයන ආයතන විසින් වර්ෂයකට $9\frac{1}{2}\%$ කට වඩා අය නොකරන්නේ නම් එම කටයුතු සඳහා දී ඇති ණය සඳහා වර්ෂයකට $6\frac{1}{2}\%$ කි.

(ආ) තේ කර්මාන්තශාලා නවීකරණය සහ / හෝ නව තේ කර්මාන්තශාලා ඉදි කිරීම සඳහා දෙන ලද, ගෙවිය යුතු පොළියෙන් කොටසක් තේ පාලක විසින් ගෙවනු ලබන, ණයවල පොළී ප්‍රමාණයන් :-

(1) ණය දෙන ආයතන විසින් තේ කර්මාන්තශාලා නවීකරණයෙහි සහ / හෝ නව තේ කර්මාන්තශාලා ඉදි කිරීමේ දේශීය වියදම් ආවරණය කිරීම සඳහා දී ඇති, මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍යෝජනයක් පතන, ණය සඳහා එම පහසුකම් සපයන ආයතන විසින් වර්ෂයකට $8\frac{1}{2}\%$ කට වඩා අය නොකරන්නේ නම් එම ණයවලට අදළ ප්‍රතිමූල්‍යෝජන ණය සඳහා වර්ෂයකට 5% කි.

(2) ණය දෙන ආයතන විසින් තේ කර්මාන්තශාලා නවීකරණයෙහි සහ / හෝ නව තේ කර්මාන්තශාලා ඉදි කිරීමේ විදේශ විනිමය වියදම් ආවරණය කිරීම සඳහා දී ඇති, මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍යෝජනයක් පතන ණය සඳහා එම පහසුකම් සපයන ආයතන විසින් වර්ෂයකට $8\frac{1}{2}\%$ කට වඩා අය නොකරන්නේ නම් ණයවලට අදළ ප්‍රතිමූල්‍යෝජන ණය සඳහා වර්ෂයකට 7% කි.

(ඇ) වාණිජ, වෙළඳ හෝ ව්‍යාපාර කටයුතු නගා සිටුවීම හෝ සංවර්ධන සඳහා වර්ෂයකට $7\frac{1}{2}\%$ කි.

1969 අගෝස්තු මස 19 වන දින, චක්‍රලේඛ අංක: 29/1 මෙයින් අවලංගු කරනු ලැබේ.

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

**චක්‍රලේඛ අංක: 36**

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1970 අප්‍රේල් මස 29 වැනි දින.

## වෙළෙඳ බැංකු ණය

1969 මැයි මස 12 වැනි දින හා අංක: 33 දරන චක්‍රලේඛයේ හා 1969 ජූනි මස 13 වැනි දින හා අංක: 33/1 දරන චක්‍රලේඛයේ විධිවිධාන 1970 ජූලි මස 31 වැනි දින තෙක් බල පැවැත්වෙන බව වෙළෙඳ බැංකුවලට මෙයින් දන්වනු ලැබේ.

**කේ. ගුණරත්නම්**
ප්‍රධාන ගණකාධිකාරී.

**ඩබ්ලිව්. තෙන්නකෝන්**
අධිපති.

චක්‍රලේඛ අංක: 37

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1970 මැයි මස 29 වන දින.

## විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ගණුදෙනු

පරිණත වන ආනයන බිල්පත් සඳහා හෝ විනිමය පාලක විසින් නිකුත් කළ බලපත්‍ර සඳහා විදේශ විනිමය ගෙවීම් සඳහා අවශ්‍ය වන වි·වි·හි·ස· හැර, තැන් මෙන්ම ඉදිරිපත් කිරීම් සඳහාද විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර (වි·වි·හි·ස·) විකිණීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවිය යුතු බව වාණිජ බැංකුවලට මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංක: 38

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1970 ජුලි මස 31 වැනි දින.

## වෙළෙඳ බැංකු ණය

1969 මැයි මස 12 වැනි දින හා අංක: 33 දරන චක්‍රලේඛයේ හා 1969 ජුනි මස 13 වැනි දින හා අංක: 33/1 දරන චක්‍රලේඛයේ විධිවිධාන නැවත දැනුම් දෙන තෙක් බල පැවැත්වෙන බව වෙළෙඳ බැංකුවලට මෙයින් දන්වනු ලැබේ.

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංක: 39

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1970 දෙසැම්බර් 15 වන දින.

## වෙළෙඳ බැංකු ණය – ආනයන ණයවර ලිපි සඳහා වන ආන්තික අවශ්‍යතා

1969 ජනවාරි 30 වැනි දින හා අංක 30 සහ 1969 පෙබරවාරි 26 වැනි දින හා අංක 30/1 දරණ චක්‍රලේඛ සම්බන්ධවයි.

ලොරි සඳහා වැසි ආනයනය කිරීම ආවරණය වන ආනයන ණයවර ලිපි සඳහා වන ආන්තික අවශ්‍යතාවයන් පිළිබඳ නියමයන් මින්පසු අදාළ නොවන බව වෙළෙඳ බැංකු වෙත මෙයින් දන්වනු ලැබේ.

1969 ජනවාරි 30 වැනි දින හා අංක 30 සහ 1969 පෙබරවාරි 26 වැනි දින හා අංක 30/1 දරණ චක්‍රලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ.

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.